**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**External Degrees and Extension Courses Unit**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**University of Sri Jayewardenepura**


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/BA/EEX15 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 011-3132496<br>011-2758233 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | ext.certi@sjp.ac.lk |


2021.05.13

ගරු ස්වාමින් වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - 2020

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් බාහිර උපාධි පාඨමාලාව සඳහා ඔබ විසින් අප වෙත එවා ඇති අයදුම්පත හා බැඳේ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2021 ජනවාරි 15 දිනැතිව 2020/1 දරණ චක්‍රලේඛනය අනුව විෂය ගොනු ක්‍රමය යටතේ ඔබ විසින් එවා ඇති **ලේඛනයන්හි නිරවද්‍යතාවය සනාථ කිරීමට යටත්ව** ඉහත උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

ඒ අනුව ඔබ තෝරා ගත් **විෂය කාණ්ඩයන් පිලිබඳව දැන ගැනීමට** external.sjp.ac.lk/reg යන වෙබ් ලිපිනය වෙත පිවිසෙන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි

**ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සඳහා 2021.05.24 දින සිට www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවියෙහි (Registration & Enrollment) වෙත පිවිස** 2021-06-15 දිනට පෙර **පහත පරිදි කටයුතු කරන ලෙස දන්වා සිටිමි.**

1. උක්ත පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට සහ ශිෂ්‍ය වාර්තා පොත සකස් කිරීම සඳහා පාස්පොට් ප්‍රමාණයේ (3.5cmx4.5cm) වර්ණ ඡායාරූපයක් www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවියෙහි (Registration & Enrollment) අදාල ස්ථානයෙහි උඩුගත (upload) කිරීම කළ යුතුය. උඩුගත කරන ඡායාරූපය සුදු පැහැ පසුබිමක වර්ණ ඡායාරූපයක් විය යුතුය.එය jpeg ආකාරයට විය යුතුය.

2. වර්ණ ඡායාරූපය උඩුගත කිරීමෙන් අනතුරුව මේ සමඟ එවා ඇති අනන්‍යතාවය තහවුරු කිරිමේ අයදුම්පතෙහි ඔබගේ ඡායාරූපයෙහි අනන්‍යතාවය තහවුරු කර එවිය යුතු අතර ඒ සඳහා රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාම විනිසුරුවරයෙකු, නීතිඥයෙකු, රාජ්‍ය සේවයේ පරිපාලන නිලධාරියෙකු හෝ රජයේ පිළිගත් ආයතනයක මාණ්ඩලික නිලධාරියෙකු විසින් අදාළ ඡායාරූපය මත අත්සන සහ නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.එම අනන්‍යතාවය තහවුරු කිරිමේ අයදුම්පතෙහි scan පිටපත (Registration & Enrollment) අදාල ස්ථානයේ උඩුගත (upload) කල යුතුය.

3. එමෙන්ම ඔබ විසින් මුදල් ගෙවා ඇති රිසිට්පතෙහි මුල් පිටපත සමග සම්පූර්ණ කල අනන්‍යතාවය තහවුරු කිරීමේ අයදුම්පතෙහි මුල් පිටපත සහ පාස්පෝට් ප්‍රමාණයේ (3.5cmx4.5cm) අමතර ඡායාරූපයක් (පිටුපස ඔබගේ අයදුම්පතෙහි අංකය සඳහන් කරන්න)<u>2021-06-15 දිනට පෙර</u> **නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැ.පෙ. අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි. (ලිපි ලේඛන බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "BA -2020 /Registration" යන්න සඳහන් කළ යුතුය.)

***<u>ඔබ විසින් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය ඇතුළු ලියකියවිලි වල නිරවද්‍යතාවය යථා කාලයේදී පරීක්ෂා කරනු ලබන අතර එම අවස්ථාවේදී අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව සනාථ වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කිරීමටත්, ඔබ විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති කිසිදු මුදලක් ආපසු නොගෙවීමටත් විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.</u>***

මෙම අසීරු අවස්ථාවේ ඔබගේත් අප කාර්ය මණ්ඩලයේත් ආරක්ෂාව උදෙසා මෙම පියවර ගෙන ඇති බැවින් නිවැරදි හා සත්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් ලියාපදිංචි කිරීමේ කටයුතු වලට සහයෝගය දක්වන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමි.



නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය